# රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව
## அரச கணக்குகள் திணைக்களம்
## Department of State Accounts

මගේ අංකය / எனது இல. / My No. **SA/MAA/02/01/01** ඔබේ අංකය / உமது இல. / Your No. දිනය / திகதி / Date **2023.10.03**


**රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශ අංක: 2023/02**

සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන්

සියලුම දෙපාර්තමේන්තු ප්‍රධානීන්

<u>වාර්ෂික මූල්‍ය ප්‍රකාශන සැකසීමේ දී විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු</u>

රජයේ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලවල පසුගිය වසර කිපයක විගණන වාර්තා පරීක්ෂා කිරීමේ දී විගණන මතය තත්ත්වාගණනය කිරීම සඳහා පදනම් වී ඇති කරුණු මෙම මාර්ගෝපදේශයේ ඡේද අංක (1), (2), (3), (4) හා (5) යටතේ දක්වා ඇති අතර සියලුම ප්‍රධාන මූල්‍ය නිලධාරීන්, ප්‍රධාන ගණකාධිකාරීවරුන් හා ගණකාධිකාරීවරුන් ඉදිරි වර්ෂ සඳහා මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී එම කරුණු පිළිබඳ විශේෂ අවධානය යොමු කළ යුතු බවට අවධාරණය කෙරේ.

1) <u>මූල්‍ය නොවන වත්කම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීමට අදාළව හඳුනාගත් අඩුපාඩු</u>

- පෙර වර්ෂයේ අවසාන ශේෂය හා සැසඳීමේ දී එළඹෙන වර්ෂයේ ආරම්භක ශේෂ වෙනස් වීම
- වෙනත් ආයතන වෙත පවරාදුන් හා අපහරණය කළ වත්කම්වල අගය වත්කම් ශේෂවලින් ඉවත් නොකිරීම නිසා වත්කම්වල අගය වැඩියෙන් දැක්වීම
- ආයතනවලට අයත් ඉඩම් හා ගොඩනැගිලි තක්සේරු කර ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම සහ තක්සේරු කළ ඉඩම් හා ගොඩනැගිලිවල වටිනාකම නිසි පරිදි ගිණුම්ගත නොකිරීම
- ආයතනවලට අයත් ඇතැම් වත්කම් අයිතමයන්ගේ අගයන් ගිණුම්ගත නොකිරීම (ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් වත්කම්)
- ව්‍යාපෘති වියදම් යටතේ (වැය විෂයය අංක 2506, 2507 හා 2509) ගොඩනැගෙන වත්කම්වල අගයන් නිසි පරිදි හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම
- වර්ෂය තුළ ප්‍රාග්ධන වත්කම් මිලදී ගැනීමේ වැය විෂයයන් යටතේ දරන ලද වියදම්වලට අදාළ සියලුම වත්කම් අදාළ වර්ෂය තුළ ගිණුම්ගත නොකිරීම
- නීත්‍යානුකූලව අයත් නොවන වත්කම් ගිණුම්ගත කිරීම හා නීත්‍යානුකූලව අයිතිය ඇති අදාළ වත්කම්වල අයිතිය පවරා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු නොකිරීම
- ඉදිකිරීම් නිම වූ පසුවත් අදාළ අගයන් ගොඩනැගිලි යටතට මාරු නොකර කෙරීගෙන යන වැඩ යටතේම තවදුරටත් පවත්වාගෙන යාම
- වත්කම් භෞතිකව හඳුනාගත හැකි පරිදි කේත අංක යොදා නොතිබීම
- ඇතැම් වත්කම්වල අගයන් ද්විගණනය වී තිබීම


මහා භාණ්ඩාගාරය, කොළඹ 01, ශ්‍රී ලංකාව පொது திறைசேரி, கொழும்பு 01, இலங்கை. General Treasury, Colombo 01, Sri Lanka.
General-Tel.: +94 11 2484500/600 Ext.: 1149 Fax: +94 11 2484869 Website: www.sad.gov.lk
Director General - Tel.: +94 11 2484728 Fax: +94 11 2473856 e-mail: dgsa@sad.treasury.gov.lk

2) <u>මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේ දෝෂ</u>

- ආදායම් ගිණුම් තැබීමේ ආයතන වෙනුවෙන් එකතු කළ ආදායම ආදායම් නොවන ලැබීම් යටතේ දැක්වීම
- මුදල් ලැබීම් හා ගෙවීම් ප්‍රභවයන් වර්ගීකරණය කිරීමේ දෝෂ
- වෙනත් වැය ශීර්ෂ වෙනුවෙන් දරන ලද වියදම් පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්වීම
- මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිළියෙල කිරීමේදී දෙසැම්බර් 31 දිනට සකස් කළ ශේෂ පිරික්සුමේ ඇති අගයන්ට වඩා වෙනස් අගයන් භාවිත කිරීම
- වෙනත් වාර්තාකරණ ආයතන විසින් දරන ලද වියදම් මුදල් ප්‍රවාහ ප්‍රකාශයට ඇතුළත් කිරීම

3) <u>අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේ දෝෂ</u>

- එකතු කළ යුතු අගයන් අඩුකිරීම් ලෙස හා අඩු කළ යුතු අගයන් එකතු කිරීම් ලෙස දැක්වීම
- අග්‍රිම සැසඳුම් ප්‍රකාශයට ගැලපිය යුතු යම් යම් අයිතමයන් නොගලපා අග්‍රිම සැසඳුම් සැකසීම
- අග්‍රිම සැසඳුම් ප්‍රකාශය පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට වඩා වෙනස් අගයන් යොදා ගැනීම

4) <u>මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේ දී යොදාගන්නා ලද සංඛ්‍යා</u>

- මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශනවල දැක්වෙන අගයන්ට වඩා වෙනස් අගයන් යොදා ගැනීම හා මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය, මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ දැක්වෙන අගයන් හා ඒවාට අදාළ අනෙකුත් ආකෘති පත්‍රවල දැක්වෙන අගයන් එකිනෙකට නොගැලපීම

  උදා: මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයේ සඳහන් වියදම හා ACA- 2 ආකෘතියට අනුව වියදම අතර වෙනස්කම් පැවතීම

5) <u>වෙනත් කරුණු</u>

- පොත්පත් හා ලේඛන පවත්වා නොගැනීම හා ඒවා නිසි පරිදි යාවත්කාලීන නොකිරීම (හානි පාඩු ලේඛනය, ඇප තැබීමේ ලේඛන ආදිය)
- දීර්ඝකාලීනව නිරවුල් නොකරන ලද අග්‍රිම ගිණුම් ශේෂයන් පැවතීම
- අත්තිකාරම් "බී" ගිණුමේ ශේෂය හා කේවළ ශේෂ එකතුව අතර හඳුනා නොගත් වෙනස්කම් පැවතීම
- දීර්ඝකාලීනව නිරවුල් නොකරන ලද අත්තිකාරම් ගිණුම් ශේෂ පැවතීම
- ගෙවීම් කරන ලද කුලී හා වැඩ අත්තිකාරම් නිසි පරිදි ගිණුම්ගත නොකිරීම
- දීර්ඝකාලීනව පවතින තැන්පතු ගිණුම් ශේෂ පිළිබඳව මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර ඉකුත් වූ තැන්පතු පිළිබඳ ලැයිස්තු පිළියෙල කර ඒවා රාජ්‍ය ආදායමට බැර කිරීමට කටයුතු නොකිරීම



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk

- ➢ තැන්පතු ගිණුම්වල පවතින හඳුනා නොගත් ශේෂ
- ➢ තැන්පතු ගිණුම් ශේෂ, කේවල ශේෂ හා නොසැසඳීම

උක්ත කරුණුවලට අමතරව ගිණුම් ප්‍රකාශ පිළිබඳව මතය තත්ත්වාගණනය කිරීම සඳහා බලපා නැති නමුත් විගණන වාර්තාවල විගණකාධිපතිවරයා විසින් පෙන්වා දී ඇති කරුණු පහත පරිදි වේ.

(i) ආදායම් හා වියදම් ඇස්තමේන්තු සැකසීමේ දුර්වලතා නිසා තත්‍ය අගයන් සමඟ සැසඳීමේදී සැලකිය යුතු ප්‍රමාණයේ විචලතා පැවතීම

(ii) වර්ෂය තුළ වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් සැලකිය යුතු ප්‍රතිශතයක් උපයෝජනය නොකිරීම සහ මු.රෙ. 66 යටතේ වැය විෂයයන් අතර මාරු කරගන්නා ලද ප්‍රතිපාදන උපයෝජනය නොකිරීම

(iii) තත්කාර්ය අතුරු අග්‍රිම නිසි ඇස්තමේන්තුවකින් තොරව නිකුත් කිරීම නිසා අදාළ මුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයක් උපයෝජනය නොකර නැවත පියවීම

(iv) තත්කාර්ය අතුරු අග්‍රිම පියවීම අදාළ කාර්යය නිම වී දින 10 ක් ඇතුළත සිදු නොකිරීම

(v) වර්ෂය අවසානයේ ඉතිරි ප්‍රතිපාදන ප්‍රමාණය ඉක්මවා බැරකම්වලට එළඹීම හා ඇතැම් බැරකම් ලැයිස්තුවට ඇතුළත් නොකිරීම

(vi) හිඟ ආදායම් එකතු කර ගැනීම සඳහා ක්‍රියා නොකිරීම

(vii) බැංකු ගිණුම්වල හඳුනා නොගත් හා නිෂ්කාශනය නොවූ චෙක්පත් දීර්ඝකාලීනව පැවතීම

(viii) ප්‍රාග්ධන ස්වරූපයේ නොවන වියදම් ප්‍රාග්ධනීත කිරීම

(ix) අදාළ කාර්යයන් නිම නොකර දීර්ඝකාලීනව තැන්පතු ශේෂ පවත්වාගෙන යාම

ඉහත කරුණුවල ප්‍රමාණාත්මකතාව මත මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණන මතය තත්ත්වාගණනය කිරීමට ද හැකියාව ඇති බැවින් එම කරුණු පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කළ යුතු ය.

එසේම විගණකාධිපති සහ අභ්‍යන්තර විගණනය මගින් ඔවුන්ගේ විගණන වාර්තා වලින් පෙන්වා දෙනු ලබන අඩුපාඩු නිසි පරිදි කළමණාකරනය කිරීමේ වගකීමද නිසි අභ්‍යන්තර පාලන ක්‍රමයක් ආයතනය තුල පවත්වාගෙන යාමද සියලු ප්‍රධාන ගණන්දීමේ නිලධාරීන් සහ ගණන්දීමේ නිලධාරීන්ගේ වගකීමක් වේ.

ඩබ්.ඒ. සමන්ත උපනන්ද
අධ්‍යක්ෂ ජනරාල්
රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව

පිටපත: විගණකාධිපති



රාජ්‍ය ගිණුම් අධ්‍යක්ෂ ජනරාල්, රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුව, මුදල් අමාත්‍යාංශය
මහ ලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව
දු.අ.- 94 11 2484728 /ෆැක්ස්- 94 11 2473856 / විද්‍යුත් තැපැල- dgsa@sad.treasury.gov.lk